# ACCOUNTING FOR PARTNERSHIP (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# හවුල් ව්‍යාපාරය විසින් හවුල්කරුවන්ට ලබා දෙන ප්‍රතිලාභ

ප්‍රාග්ධනය සැපයීමෙන්, කළමනාකරණයට දායකත්වය දීමෙන්, අවදානම් දැරීම තුළින් හා ව්‍යාපාරයට ණය සැපයීම මඟින් හවුල්කරුවන් විසින් හවුල් ව්‍යාපාරයට දායකත්වය සැපයිය හැකිය.

හවුල්කරුවන් විසින් වෙනත් ව්‍යාපාරයක / වෙනත් ආයෝජනයක් කැපකර, හවුල් ව්‍යාපාරයේ ප්‍රාග්ධනය යොදා ඇති බැවින් ආවස්ථික පිරිවැය සංකල්පයට අනුව හවුල් ව්‍යාපාරය විසින් ඔවුන්ට ප්‍රාග්ධන පොළී ගෙවීම වඩාත් යෝග්‍ය ය.

එසේ ම කළමනාකරණයට දායකවීම, හා අවදානම් දැරීම හේතුවෙන්ද හවුල් ව්‍යාපාරය විසින් ඔවුන්ට ප්‍රතිලාභ දීම යෝග්‍ය ය.

හවුල් ව්‍යාපාර ගිවිසුමට අනුව, හවුල්කරුවන් විසින් හවුල් ව්‍යාපාරය වෙත ප්‍රාග්ධනය යෙදීම නිසා පොළියත්, හවුල් ව්‍යාපාරයේ කළමනාකරණයට දායක වීම නිසා වේතනත්, අවදානම් දැරීම වෙනුවෙන් ලාභ කොටස්, ප්‍රතිලාභ ලෙස ලැබේ.

ClassworkLK

හවුල්කරුවන් විසින් හවුල් ව්‍යාපාරයට සපයන ණය සඳහා පොළී ලැබීම ද හවුල්කරුවන් වෙත හවුල් ව්‍යාපාරයෙන් ලැබෙන ප්‍රතිලාභයකි.

හවුල්කරුවන් සපයන සේවාවන් අනුව ව්‍යාපාරයට විවිධ වූ ප්‍රයෝජන ලබා ගත හැකිය.

හවුල් ව්‍යාපාරය විසින් හවුල්කරුවන්ට ලබා දෙන ප්‍රතිලාභ ව්‍යාපාරය උපයාගත් ශුද්ධ ලාභයෙන් බෙදාහරින්නේ මේ ආකාරයෙනි.

- ප්‍රාග්ධන පොළී
- හවුල් වේතන
- ලාභ කොටස්

මෙම ප්‍රතිලාභ ගෙවීම වියදම් ලෙස නොසලකන අතර, ඒවා ව්‍යාපාරයේ **ලාභය බෙදාහැරීමක්** ලෙස සැලකේ.

හවුල්කරුවන් ව්‍යාපාරයට සපයන ණය සඳහා පොළිය ව්‍යාපාරයේ වියදමක් සේ සලකයි. එයට හේතුව එම ණය මුදල ව්‍යාපාරයේ කටයුතු සඳහා ලබා ගන්නා බැවිනි.

ClassWork.LK

# අභ්‍යාස

(01) හවුල්කරුවන් යෙදූ ප්‍රාග්ධනය සඳහා පොළී ගෙවීම සාධාරණයයි ඔබ සිතන්නේ ද? හේතු දක්වන්න.

(02) හවුල්කරුවන්ගේ අවදානම අනුව ලාභ බෙදා ගැනීම සෑම විටම සිදුවේ ද? හේතු දක්වන්න.

(03) හවුල්කරුවන්ට වඩාත් සාධාරණ ආකාරයෙන් හවුල් වේතන ගෙවීම කළ හැකි ආකාරය දක්වන්න.

(04) හවුල්කරුවන්ගෙන් හවුල් ව්‍යාපාරයට ලැබෙන ප්‍රයෝජන කවරේද?

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura